# කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
# දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

## සවිස්තරාත්මක අධ්‍යයන වාර්තා
## ලබාගැනීම හා උපාධි ප්‍රදානෝත්සවය සඳහා අයදුම් කිරීම

ව්‍යාපාර කළමනාකරණවේදී (සාමාන්‍ය) උපාධියට අදාළව 2025 අගෝස්තු මස 01 හා 27 යන දිනවල නිකුත් කරන ලද උපාධිලාභී නාමලේඛනයන් හි නම් සඳහන් උපාධිලාභීන් හට සවිස්තරාත්මක අධ්‍යයන වාර්තාව (Academic Record) **2025 සැප්තැම්බර් මස 01 හා 02 යන දිනයන්හි දී** ලබාගත හැක.

ඒ සඳහා දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයේ වෙබ් අඩවියට පිවිස බාගත කරගත් අයදුම්පත නිසි ලෙස සම්පූර්ණ කර නියමිත මුදල් ගෙවීමෙන් අනතුරුව පහත දැක්වෙන **එක් ක්‍රමයක්** මගින් ලබාගැනීමට හැකියාව පවතී.

01. දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය වෙත අයදුම්පත හා මුදල් ගෙවන ලද වවුචර්පත මධ්‍යාහ්න 12.00 ට පෙර ගෙනැවිත් බාරදීමෙන් එදිනම ලබාගත හැක.

02. අයදුම්පත හා මුදල් ගෙවන ලද වවුචර්පත **"නියෝජ්‍ය ලේඛකාධිකාරී, දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය, අංක. 56/6, කෝන්ගහවත්ත පාර, නුවර පාර, කිරිබත්ගොඩ."** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමුකිරීමෙන් පසු තම පෞද්ගලික ලිපිනයට ගෙන්වා ගත හැක.

එසේම ඉහත උපාධි පාඨමාලාවන්ට අදාළ උපාධිලාභීන් සඳහා නියමිත උපාධි ප්‍රදානෝත්සව අයදුම්පත් **2025.09.01** දින සිට අප වෙබ් අඩවියෙන් **(www.cdce.kln.ac.lk)** බාගත කර ගැනීමේ හැකියාව පවතින අතර එසේ බාගත කරගත් අයදුම්පත් **2025.09.15** දිනට පෙර නියමිත පරිදි සම්පූර්ණ කර ඉහත දක්වා ඇති ලිපිනයට තැපැල් කළ යුතුය.

නියෝජ්‍ය ලේඛකාධිකාරී,
දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය,
කැලණිය විශ්වවිද්‍යාලය,
කැලණිය.
2025.08.30